**කොවිඩ් 19 - සති පාසල**

**2021 - තුන්වන වාරය - සිව්වන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

## 5 පාඩම - නිෂ්පාදන කර්මාන්ත

**විද්‍යුත් කර්මාන්තය හා කපු පිළි කර්මාන්තය (පෙළ පොත පිටු අංක 102-108 )**

- දෛනික මානව අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය විද්‍යුත් උපකරණ නිෂ්පාදනය කිරීම විද්‍යුත් කර්මාන්තය යටතේ සිදු කෙරේ.
- මෙම කර්මාන්තය මගින් නිපදවනු ලබන ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන අතරින් දත්ත සැකසීමේ උපකරණ හා විද්‍යුත් සන්නිවේදන උපකරණ නිෂ්පාදනය ප්‍රධාන වී ඇත.
- විද්‍යුත් උපකරණ අපනයනය කරනු ලබන රටවල් විසින්ම ආනයනය සිදු කිරීමද විද්‍යුත් උපකරණ වෙළඳපළෙහි දක්නට ඇති කැපී පෙනෙන ලක්ෂණයකි.
- ශ්‍රමිකයින්ගෙන් වැඩි පිරිසක් විද්‍යාඥයින්, ඉංජිනේරුවන්, පුහුණු කාර්මික ශිල්පීන් හා පර්යේෂකයන් වීම ද මෙම විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයේ සුවිශේෂී ලක්ෂණයක් වේ.
- යුරෝපයේ ඇති වූ කාර්මික විප්ලවය සමඟ කපු පිළි නිෂ්පාදනය විධිමත් කර්මාන්තයක් ලෙස සංවිධානාත්මකව ව්‍යාප්ත විය.
- බ්‍රිතාන්‍යය මෙහි ඒකාධිකාරය හිමිකරගෙන ඇත. පසු කලෙක චීනය, ඉන්දියාව, ඊජිප්තුව, ජපානය වැනි රටවලට ව්‍යාප්ත විය.
- යාන්ත්‍රීකරණය මගින් තත්ත්වයෙන් උසස් නිෂ්පාදන බිහි කිරීමට වර්තමානයේ හැකි වී ඇත.

**ක්‍රියාකාරකම**

01. විද්‍යුත් උපකරණ නිෂ්පාදනය හා සම්බන්ධ අතුරු නිෂ්පාදනයන් කිහිපයක් නම් කරන්න.

02. විද්‍යුත් නිෂ්පාදන සඳහා ලොව ප්‍රමුඛ රටවල් පහක් ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

03. විද්‍යුත් කර්මාන්තය යටතේ නිපදවනු ලබන නිෂ්පාදන අතරින් ප්‍රධානත්වයක් ගන්නා නිෂ්පාදන ක්ෂේත්‍ර ප්‍රතිශතය සමඟ පිළිවෙලින් දක්වන්න.

04. විද්‍යුත් කර්මාන්තයෙහි දක්නට ඇති ලක්ෂණ හා ප්‍රවණතාවන් තුන බැගින් ලියන්න.

05. මුල් යුගයේ කපු පිළි කර්මාන්තය සම්බන්ධයෙන් ඒකාධිකාරීත්වයක් හිමිකර ගන්නා ලද රට කුමක්ද?

06. පසුකාලයේ දී වෙනත් රටවල් කරා කපු පිළි කර්මාන්තය ව්‍යාප්ත වීමට හේතු පහක් ලියන්න.

07. ලෝකයේ කපු වගාකරන ප්‍රදේශ හා කපු පිළි නිපදවන රටවල් ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

08. කපු පිළි කර්මාන්තයෙහි කැපීපෙනෙන ලක්ෂණ හා ප්‍රවණතාවන් දෙක බැගින් ලියා පැහැදිලි කරන්න.